

# ආරි අයියාට ලියමි

## විමල් කැටිපෙආරච්චි

සේරිවාණිජ සිස්ටම් එකට එරෙහිව
මීරි නැති ජීවිතේ කල්වාරි නගිමින
ධාරිතාවය මනින මාපක ගොළු කර
ආරි අයියා පක්ෂෙ වැඩ තාම පෙර ලෙස

බුලත් විට රතු පාට කිසිවිටක නොමැකෙන
අලූත් වෙන ෆොන්ට් මැද නොනවතින පින්සල
මලූත් දහසක් පිජේ කටවුට් කෙළවර
යළිත් සිපගම් ලැකර් සුවඳති හදවත

විරු සමරු අප්‍රේල් ඉල්මහේ මැයි දිනේ
සුරු අතක් වැඩකරයි රටා මවමින් දස අතේ
දැරු පිපාසා ක්ෂුදා ගිනි නොපෑ මදහසේ
හිරු මඬල වළව්වේ සහ පොල්වත්ත හන්දියේ

ප්‍රචාරක වැඩ ඇතුළෙ පණ ගැහෙන දෑස
සුදාලට සුසාලට සහෝදර හෙවණ
ලියා කවියකින් හෝ දුප්පත්ව මෙහෙම
බදාගෙන මට උඹව ඉඹින්නට ඕන

ටැපටා යටින් ගලනාවූ ඩා ගගටා
සැපටා ලොවට මිස නොව තමන් හිසටා
අපටා යනු නුහුණු මග යන සොයුර යසටා
තොපටා එවමි මැයි මල් මෙලෙස දවටා



# ඩී බී නිහාල්සිංහයනුත් අප හැර ගිහින්....

## චන්දන ගුණසේකර

එක්සත් රාජධානිය



රිදී සිනමා කැණි මඩල
බර දරා වුන් කුළුණු පෙළ
එකින් එක ඉවත්වී යන සඳ
දුක දරන්නේ කොහොම
අතු පතර විදාලු
විසල් තුරු පියස ලෙස
සෙවණ සහ රැකවරණ
සැලසුවා ඔවුන් යටි පෙළට
එහෙත් උන් ඉසිඹුලන අද දින
නිරාවරණය වේය යටි පෙළ
ඉන් ලබා හිරු එළිය යහමින
දිනෙක මහ ගස් වී හැදෙන බව
සිතා සිත සනසගමි මම



# අන්ධ ළමයා

## කේයස් - සාගර පලන්සූරිය

මල් ලස්සනයි හොඳ හොඳ පාටයි කීවා
පෙනෙනවා දකිනවා කියනා ඒවා
මොනවද අම්මෙ මම අහගන්නට ආවා
තෝරා දෙන්න මම දන්නේ නෑ මේවා

මල්වල හොඳ සුවඳ මිස පාටක් කොහෙද
ඒවා මොළොක් බව තේරෙනවා මටද
එළියක් කියා මොකවත් හෙම තියෙනවද
මට තේරුම් ගන්ට අම්මේ බැරි මොකද

උණුසුම දැනේ දහවල මට රැයට වඩා
වෙනසක් හෙම තියෙනවද මෙහි මෙයට වඩා
මට නොදැනෙන්නෙ මා කණ කොලුවෙකිලූ කුඩා
ලොකු වෙන කොට දැනේවිද මම අසමි හඬා

ඇඟිලි තුඩට මල් පෙති වල ඇති මෙළෙක
මට දැනෙනවා එය අල්ලන හැම විටෙක
පාට කියා ඇත්නම් ගතියක් මලෙක
අම්මේ අත නොගෑවෙන එක තමයි දුක

ලස්සන කියන දේ නැහැයට වත් කනට
මගේ දිවට හරි මගෙ අත පය වලට
නොදැනෙන්නේ මොකද තෝරා දෙන කලට
ඉවසා ගෙන ඉන්න අම්මේ බැරිය මට

ඇයි අම්මේ අඬන්නේ මේ කඳුලූ සලා
මට දැනෙනවා යයි මගෙ අත් දිගට ගලා
නාඬන් අම්මෙ නාඬන් මම විහිළු කළා
එන්නද ගොසින් බොරු කී කොල්ලන්ට තලා

**කේයස් - සාගර පලන්සූරිය**
**සුදෝ සුදු**
**සිත්තම - කුමුදු තාරක**

# පතිකුලයට යන දෝණිට

## අසෝකා දේවසුරේන්ද්‍රා

ලෝරියන්ට් - ප්‍රංශය

හිරු කිරණක් වගේ නිවසම එලිය කරන්
පොඩි දූ කුමරියක් ආවා සතුට අරන්
ඒ පොඩි දෝණි අද කුමරෙකු හා සමගින්
කුලගෙට පිය නගයි සැම ආසිරි මැද්දෙන්

මගෙ මේ අවවාද ටික දියණියෙ නුඹට
ජීවිතයට වටී , නොකියා බැරිය මට,
මා ලැබූ අත් දැකුම් මේ ලෙස ලීවාට,
නුඹටත් උරුමමයි මේ සැම ගනු සිතට.

සැකයේ යක්ෂමයා ගෙදරට ගන්න එපා
ගෙයි ගිනි, කිසි විටක පිටතට දෙන්න එපා
එලෙසම පිටත ගිනි, ගෙතුලට ගන්න එපා
මේවා ගත්තොතින් දිවියම වේවි අපා

දෙදෙනෙකු සමගියෙන් සතුටින් සිටින විට
ඊරිසියාව මතුවෙයි බොහො දෙනා හට
වෙද, හෙද කමෙන් සුවයක් නොලබන ලෙඩට,
ඉවසීමෙන්ම ලැබ ගත හැක සිත සතුට

ලස්සන මල් පියලි අපෙ පාවාඩ වෙලා,
ඇවිදින්නට සිහින මැව්වත් අපි, නුඹලා
ඉඳහිට ඇනෙන විස උල්කටු ගලවාලා
යනු මැන එයත් ජීවිත පාඩම් සිතලා.

ජීවිත ගමනෙ ඇතිවෙයි නිතරම ගැටලූ
ඉවසීමෙන්ම විසඳිය හැක මේ සියලු
දෙදෙනා අතර විශ්වාසයෙ නැගෙන දලු
මේවා මොනවාද, නිතරම වේය සුලු.

කිසිවිට නුඹලාට කරදර එන්න එපා
ආවත් ඒවාට කලබල වෙන්න එපා
කිසිවිට හිතෙන් නුඹ දුරුවල වෙන්න එපා
දෙදෙනගෙ ආදරයෙ වෙනසක් වෙන්න එපා

විශ්වාසයයි ආදරයයි එකට බැඳ
නෑසිය මිතුරනගෙ ආසිරි ගීත මැද
නුඹ පා තබන මේ සුන්දර ගමන අද
හෙට දින බබලවනු, පරදා හිරු සඳුද

ජීවිත ගමන නැලැවිලි ගීයක් වෙන්න
දූ දරුවන් සමග , සතුටින් ගතවෙන්න
දෙදෙනා පතන සුන්දර ලොව රජයන්න
ආසිරි පතමු අපි, හදපතුලෙන් මෙන්න

# මා දුටු කැන්ගරු දේශය

## දයා විජේසුරිය

බෙරික්

මවුබිම මගේ සුන්දර සිරිලකේ සිට
මම පැමිණියෙමි කැන්ගරු දේසෙ විසී මට
ඉසිඹුලමින් මෙහි සුවසිරි විඳී මට
දෙයිවය ලබාදුන් පිනෙකැයි සිතේ මට

බැලූ බැලූ සැමතැනම සුවිසල් මැදුරු දිසේ
සැම අත දිවෙන මංමාවත් විසිර ඇතේ
දෙස බස රැස වෙනස් වූවත් එකම ලෙසේ
සහයෝගයෙන් සතුටින් ජනහමුව වෙසේ

රටතුල නිසි අයුරු යහ පාලනය ඇත
නිතිය සැමට පොදුබව සැලසිලා ඇත
අලස නොවී පැවරුණු වගකීම වෙත
වගවීමෙන් සැමට ජයසිරි ලැබී ඇත

පන්සල් පල්ලි කෝවිල් ආදී තැන් වෙත
නිදහස් පරිදි ජනයා රැස් වෙනවා ඇත
බවුන් වැඩීමට නිසි සෙනසුන්ද ඇත
බොදු දන නිවන් මග වෙත යොමුකරනු ඇත

කෙලි බිම් වගා බිම් තණ බිම් ඇත අවට
යාරා ගඟ ගලයි පාලම් වලින් යට
සරු සාරවත් කරමින් නිජබිම අවට
ලැබදෙයි සමව කොයි කාටත් සුව සතුට

කනබොන බොජුන් හල් දිව රෑ තිබෙනු පෙනේ
නෙකවිධ රැඟුම් හා රල'හල්ද පෙනේ
සංහිඳියාව නිසසල බව තිබෙනු දැනේ
පිං ඇති පිරිස් මේ රට තුල වෙසෙනු පෙනේ

කෙටි ඉතිහාසයක් ඇති මේ රට මෙලෙස
දියුණුව කරා යන්නට හේතුව කෙලෙස
වුණිදැයි සිතන විට ම සතු පොඩි මනස
මගේ රට සමය වෙනුවෙන් දුක් වෙයි මෙලෙස

